**ශීර්ෂය 106 - ආපදා කළමනාකරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 106 - ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 22 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,501.92 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 2,485.93 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,015.99 ක් හෙවත් සියයට 29.00 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| පුනරාවර්තන | 1,292.50 | 732.96 | 559.54 | 43.29 |
| මූලධන | 2,209.42 | 1,752.97 | 456.45 | 20.66 |
| **එකතුව** | **3,501.92** | **2,485.93** | **1,015.99** | **29.00** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 10601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 140.00 | 112.87 | 70.50 | 104.43 | 300.00 | 12.81 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0385/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.142,077 ක් විය.

**2.4 තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 2.13 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0013/0056/000 | 0.11 |
| 6000/0000/00/0016/0037/000 | 1.98 |
| 6000/0000/00/0012/0079/000 | 0.04 |
| **එකතුව** | **2.13** |

**2.5 විගණන නිරීක්ෂණය**

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3 ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමුටුවේ පැමිණීමේ ලේඛන පවත්වා නොතිබුණු අතර, අනෙක් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| **(i)** | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවේ පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය. | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iv) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 |
| (v) | විදුලි උපකරණ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (vi) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (vii) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 |
| (viii) | වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645 (අ) |
| (ix) | වාහන ලැයිස්තුගත කිරීම් ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |

### 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 10601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට හිඟ හිට තිබුණු වර්ෂ 2 කට වැඩි කාලයක සිට පැවැත එන එකතුව රු. 215,893 ක් වූ ණය ශේෂ අයකර ගැනීම සඳහා අමාත්‍යාංශය ගෙන තිබුණු පියවරයන් අසාර්ථක වී තිබුණි.

### 3.3 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශාය විසින් එම වාර්තා 2016 ඔක්තෝබර් 11 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

(ii) 2015 වර්ෂයට අදාළ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත වාහන 32 ක් ලබා දී තිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතු රු.3,848,889 ක් වටිනා රූඩ් 3 යි පර්චස් 36.5 ක ඉඩම හා මහල් 4 ක ගොඩනැගිල්ල 2012 වර්ෂයේ සිට ආපදා කළමනාකරණ අමාත්‍යාංශය භාවිතා කර තිබුණත්, එම ඉඩම සහ ගොඩනැගිල්ල පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි.
අමාත්‍යාංශ ගොඩනැගිල්ල සහිත ඉඩම පවරා දෙන ලෙස දන්වා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත 2016 ජනවාරි 09 සහ 2016 අප්‍රේල් 05 දිනැති ලිපි ඉදිරිපත් කර තිබුණත් රාජ්‍ය ආයතන කොළඹ නගරයෙන් පිටතට ගෙන යාමට කටයුතු කරමින් සිටින බැවින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතු ඉඩම අමාත්‍යාංශය වෙත පවරාදීම තාවකාලිකව අත්හිටුවා ඇති බව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

**3.4 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 104(3) | | - වාහන අනතුරක් සිදුවී දින 7 ක් ඇතුළත ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවත් අමාත්‍යාංශය සතු අනතුරට පත්වී |

| | | | |
|---|---|---|---|
| | | | තිබුණු වාහන සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි |
| **(ආ)** | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**<br>**-----------------------------** | | |
| (i) | 2.8.3 මාර්ගෝපදේශය | 988,475 | තිර රෙදි මිලට ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් පිරිවිතර සකස් කර නොතිබුණි. |
| (ii) | - එම - | 1,782,828 | පැන්ට්‍රි කබඩ් සෑදීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවකින් පිරිවිතර සකස් කර නොතිබුණි. |
| (iii) | 2.14.1 මාර්ගෝපදේශය | 988,475 | රු.මිලියනයක් දක්වා වටිනා භාණ්ඩ මිලදී ගැනිම සඳහා අවම වශයෙන් ආයතන 3 කින් ලංසු කැඳවිය යුතු වුවත්, එක් ආයතනයකින් පමණක් ලංසු කැඳවා එම ආයතනයෙන් මිලදී ගෙන තිබුණි. |
| (iv) | 4.3.1. හා 4.3.2 මාර්ගෝපදේශ | - | වර්ෂාමාන මිලදී ගැනීමේදී මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. |
| (v) | 7.7 මාර්ගෝපදේශය | | වර්ෂාමාන මිලදී ගැනීමට ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණු නිසා ලංසුකරුවන් විසින් ඉදිරිපත් කර තිබුණු මිල ගණන් සංසන්දනය කිරීමට නොහැකි වී තිබුණි. |

**3.5 විදේශාධාර ව්‍යාපෘති**

**------------------------**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූලාශ්‍රය යටතේ ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘති ගිවිසුම අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැයවල එකතුව රු.මිලියන 249.22 ක් වූ අතර ඉන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 54.78 ක් උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දේශගුණික විපර්යාස සඳහා අනුගතවීමේ ව්‍යාපෘතිය යටතේ 2015 සැප්තැම්බර් 03 දින අනුමත කරන ලද 2015 වර්ෂය වෙනුවෙන් වූ වාර්ෂික වැඩ සැලැසුම අනුව රු.මිලියන 172.12 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදනය ව්‍යාපෘතියේ මූලික ආයෝජන පිරිවැය වූ රු.මිලියන 422.54 කින් සියයට 40.74 ක ප්‍රමාණයක් වී තිබුණි. තවද, 2015 වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ තථ්‍ය අරමුදල් උපයෝජනය රු.මිලියන 148.14 ක් වී තිබුණු අතර එය ව්‍යාපෘතියේ මූලික ආයෝජනය පිරිවැයෙන් සියයට 35.06 ක් වී තිබුණි.

(ii) ආපදා අවදානම් කළමනාකරණය සඳහා ආපදා අවමකරණය යථා තත්ත්වයට පත්කිරීම ප්‍රධාන ප්‍රවේශයන්ට අනුගතවීමේ ව්‍යාපෘතිය යටතේ ලැබී තිබුණු රු.මිලියන 34.09 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 12.36 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි. ඉන් රු.මිලයන 21.73 ක ප්‍රතිපාදන 2015 දෙසැම්බර් 31 දින වන විට ආපසු යවා තිබුණි.

තවද ,ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් අතුරින් උතුරු නැගෙනහිර පළාත්වල නගර 10 ක් සඳහා අවදානම් පැතිකඩ සකස් කිරීම කළ යුතුව තිබුණි. එමෙන්ම ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, ඒ යටතේ ඇති ආයතන වල හා අනිකුත් අදාළ ආයතනවල කාර්ය මණ්ඩල සඳහා ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ධාරිතා වර්ධනය කිරීම කළ යුතුව තිබුණි. එම සංරචක දෙක ව්‍යාපෘති ක්‍රියාත්මක වූ කාල සීමාව තුළදී ආරම්භ කර නිම කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අපොහොසත් වී තිබුණි.

(iii) දේශගුණික විපර්යාස සඳහා අනුගතවීමේ ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- නිකවැරටිය වැවේ රොන්මඩ නිසි පරිදි ඉවත් නොකිරීම නිසා ජලජ පැළෑටි විශාල ලෙස වැවී තිබීම, වැව් බැම්ම බොරළු පස දමා තැලිය යුතු වුවත් නිසි පරිදි ඉටු නොකිරීම නිසා වැව් බැම්ම දිගටම පුපුරා තිබීම, වේලි පද්ධතිය සකසා නොතිබීම හා කන්න 4 ක් කුඹුරු වගා නොකිරීම ආදි අඩුපාඩු විගණනයේදී අනාවරණය විය.

- කුඹුක් ගහ වැවේ මැනුම් පත්‍ර අනුව අවසන් බිල්පත ගෙවා තිබුණද, ඊට පසුවද ඉදිකිරීමේ කටයුතු කර තිබුණි. වැව් බැම්මේ ජල කාන්දුවක්ද සිදුවන බව නිරීක්ෂණය විය.

(ආ) විදේශාධාර ව්‍යාපෘතිවල ඇතුළත් සමහර කර්මාන්ත අතහැර දැමීම.

------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දේශගුණික විපර්යාස සඳහා අනුගතවීමේ ව්‍යාපෘතියේ 2015 වර්ෂයේ වැඩ සැලැසුම අනුව කෘෂිකර්ම සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම වැඩ සටහන ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2015 දෙසැම්බර් 29 දින අත්තිකාරම් වශයෙන් රු.10,823,520 ක් ප්‍රධාන ලේකම් (වයඹ) වෙත ගෙවා තිබුණි.

(ii) දේශගුණික විපර්යාස සඳහා අනුගතවීමේ ව්‍යාපෘතිය හා සම්බන්ධව ක්‍රියාත්මක වූ දිවිනැගුම වැඩසටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.21,596,740 ක් වැය කර 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද පෝෂණ කිකිළි ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර අත්හැර තිබුණි.

(iii) 2015 වර්ෂයට අදාළව දේශගුණික විපර්යාස සඳහා අනුගතවීමේ ව්‍යාපෘතිය විසින් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.4,685,140 ක ප්‍රතිපාදන සහිතව ජාතික, දිස්ත්‍රික් හා ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් සඳහා වූ දේශගුණික විපර්යාස අවදානම් අවම කිරීමේ දැනුවත් කිරීමේ වැඩසටහන් 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv) ව්‍යාපෘතිය යටතේ පුහුණුවීම් කටයුතු 2015 වර්ෂයේ ආරම්භ කර නොතිබුණි.

(v) ව්‍යාපෘතියේ කටයුතු යටතට ගැනෙන වගා කටයුතු හා වැව් සම්බන්ධ කටයුතු කුරුණෑගල දිස්ත්‍රික්කයේ පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

**(ඇ) ව්‍යාපෘති මඟින් මිලදීගත් භාණ්ඩ නිෂ්ක්‍රියව පැවතීම.**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවතුණු දිවි නැගුම ව්‍යාපෘතිය මඟින් 2015 මැයි 20 දින දේශගුණික විපර්යාස සඳහා අනුගතවීමේ ව්‍යාපෘතිය වෙත ලබා දුන් භාණ්ඩ වර්ග 08 කින් භාණ්ඩ අයිතම 36 ක් භාවිතයෙන් තොරව මාස 09 ක කාලයක් ව්‍යාපෘති කළමනාකරණ ඒකක ගබඩාවේ අසුරා තිබුණි. 2015 මැයි 20 දින වාරියපොළ ක්ෂේත්‍ර කාර්යාලය වෙත ලබා දෙන ලද භාණ්ඩ වර්ග 9 කින් අයිතම 10 ක් 2016 පෙබරවාරි 17 දින භෞතික පරීක්ෂණ අවස්ථාව වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**3.6 කාර්යසාධනය.**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

ස්වභාවික ආපදාවලට ඔරොත්තු දෙන නිවාස 71 ක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 24 ක් සඳහා රු.මිලියන 35.50 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානයට දිස්ත්‍රික්ක 7 ක නිවාස 21 ක් පමණක් අවසන් කර තිබුණි. එසේම 2014 වර්ෂයේ ඉදිකිරීමට යෝජිතව තිබූ නිවාස 145 කින් නිවාස 24 ක් 2015 වර්ෂයේදී අවසන් කර තිබුණු අතර ඉතිරි නිවාස 42 ක් 2016 ජූලි මාසය වන විටත් අවසන් කර නොතිබුණි.

**3.7 පාඩු හා හානි**

චීන රජයේ ආධාරයන් වශයෙන් ලැබී තිබුණු 3000/KVA ධාරිතාවයේ ඩීසල් ජෙනරේටර් 2 ක් වරායෙන් නිදහස් කර ගැනීමේදී ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු වශයෙන් රු.මිලියන 3.30 ක් ගෙවා තිබුණි. එසේම එම භාණ්ඩ සම්බන්ධයෙන් රු.මිලියන 35.01 ක බදු මුදල් ගෙවා තිබුණි. කෙසේ වෙතත් මෙම විදුලි ජනක යන්ත්‍ර දෙකම ලංකා විදුලි බල මණ්ඩලය වෙත නිදහස් කර තිබුණි.

## 3.8 මානව සම්පත් කළමනාකරණය.

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව.

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 20 | 03 |
| (ii) | තෘතීයික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතීයික මට්ටම | 445 | 393 | 52 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 47 | 34 | 13 |
| | **එකතුව** | **519** | **449** | **70** |

### (ආ) දේශගුණ විපර්යාස සඳහා අනුගතවීමේ ව්‍යාපෘතියේ මානව සම්පත් කළමනාකරණය.

කාර්මික සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් එම නිලධාරීන් අනුයුක්ත කරන ලද තනතුරු නාම හා තනතුරු සංඛ්‍යාව අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු තනතුරු නාමය | ලබා දී ඇති තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාවේ වෙනස |
|---|---|---|---|---|
| **ව්‍යාපෘති කළමනාකරණ ඒකකය** | | | | |
| ව්‍යාපෘති නිලධාරී | 01 | - | - | 01 |
| සංවර්ධන නිලධාරී | 03 | සංවර්ධන සහකාර | 02 | 01 |
| රියදුරු | 01 | - | - | 01 |
| **ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය** | | **ආපදා කළමනාකරණ අමාත්‍යාංශය** | | |
| සංවර්ධන සහකාර | 01 | - | - | 01 |
| - | - | කළමනාකරණ සහකාර | 02 | (02) |
| **දිස්ත්‍රික් ලේකම් කාර්යාල** | | | | |
| නියෝජ්‍ය ව්‍යාපෘති සම්බන්ධීකාරක | 03 | - | - | 03 |
| **එකතුව** | **09** | | **04** | **05** |

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් අනුමත කර ගෙන තිබුණු තනතුරු සහ කාර්යයන්, දැනට ව්‍යාපෘතියේ කටයුතු ඉටුකරන ආපදා කළමනාකරණ ඒකකයේ තනතුරු හා කාර්යයන්වලට අනුකූලවන පරිදි සංශෝධනය කර ගැනීමට ආපදා කළමනාකරණ අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.